

# සංගීතවේදියෙක් වීමට නම් ......

ශාස්ත්‍රපති
**අනිල් මිහිරිපැන්න**

මගේ ප්‍රථම ලිපියේ මාතෘකාව වූයේ වර්තමානයේ සංගීතවේදීන් බිහි නොවන්නේ ඇයි? මේ පිළිබඳව ප්‍රශංසා කර බොහෝ විචාරකයන් මා වෙත දුරකථන හා ඊ-තැපැල් මගින් දන්වා ඇත. එය තවත් ලිපි ලිවීමට ධෛර්යවන්ත වන බව කිව යුතු වේ.

මීට පෙර මවිසින් සපයන ලද ලිපියේ සඳහන් වූයේ වර්තමානයේ ප්‍රබුද්ධ සංගීතඥයන් බිහි-නොවන්නේ ඇයි යන්න පිළිබඳ අපි සාකච්ඡා කළෙමු. ගීයක් ගැයූ පමණින් හෝ යම් භාණ්ඩයක් වැයූ පමණින් සංගීතඥයන් යැයි හඳුන්වා ගනු ලබන්නේ මොනයම් අඩුපාඩුවක් තිබෙන නිසා බව දනිමි. ලෝකයේ හැමෝටම සංගීතඥයන් වීමට නොහැකිය. සංගීතඥයකු වීමට කරුණු කීපයක් බලපාන බව මගේ අදහසයි.



1ග ජානවලින් ලබන වාසනාව,
2ග සංගීතය පිළිබඳ පරිචයක් ඇති ගුරු ඇසුර
3ග අභ්‍යාස කිරීමට ඇති අවශ්‍යතාවය සහ ඉඩකඩ
4ග සංගීතවේදියකු වීමට තමා තුල ඇති අධිෂ්ඨානය

මේ කරුණු සපුරාලන කෙනෙකුට සංගීතඥයකු වීමට ඇති හැකියාව ඉමහත්ය. සමහර අවස්ථාවල මේ ඉහතින් දක්වන කිසිම හේතුවක් නොමැතිව ගායකයන් වූ අය ලෝකයේ කොතනත් දක්නට ලැබෙන කරුණකි. ඒ ප්‍රථමයෙන් කියූ ජාන නිසා විය හැක. නමුත් සියලු දේ සුදුවන්නේ ජාන නිසා නොවන බවද දැන ගත යුතුය. ලංකාවේ සුප්‍රසිද්ධ ගායක ගායිකාවන් සමග සාකච්ඡා කළ විට ඉහත කී ජාන ඔවුන්ට නොමැති බව සඳහන් කිරීමට කැමතිය. එය පිනට පහළ වන්නක් යැයි කිව-හොත් නිවැරදිය. බොහෝ අයට ගීතයක් ගයා සංගීතඥයකු වීමේ ප්‍රබල අවශ්‍යතාවයක් තිබෙන බව අපි දනිමු. සංගීතඥයකු වීමේ ප්‍රථම අදියර විය යුත්තේ ජානවලට පසුව සංගීතය පිළිබඳ පරිචයක් ඇති ගුරු ඇසුරය. මෙයින් මා අදහස් කරන්නේ නෑ සංගීත විශාරදවරයකු විය යුතුයි කියා. කෙසේ හෝ ස්වර පාලනය කළ හැකි තැනැත්තෙක් විය යුතුමය. සංගීතය දන්නා බව කියූ පමණින් ඔහු වෙත නොයා යුතු බව මට හැඟේ. ශාස්ත්‍රීය සංගීතය සහ ජන ගී යන කොටස් දෙකෙන් මා මේ කියන කරුණු වැදගත් වේ. ජන ගීවලට ශාස්ත්‍රීය දැනුමක් ඇති ගුරුවරයෙක් අවශ්‍ය වන්නේ නැත. එනමුත් මෙයට ද ගැමි ගීයක් කිවහැකි වැඩිහිටියෙක් අවශ්‍ය බව කිව යුතුය.

අප රටේ බහුතරයක් අදහන බුද්ධාගමේ මූලාශ්‍රය වූයේ භාරතයයි. එබැවින් සංගීතය පිළිබඳව කතිකා කරන විට එහි මූලාශ්‍රය ද භාරතයේ අංග උපාංග සමග ගැළපිය යුතු වේ.

ශ්‍රී ලාංකික සංගීතවේදියෝ භාරතයේ ප්‍රකාශිත අප්‍රකාශිත බොහෝ ගුරුකුල තිබෙන බව අදහන කරුණකි. මෙයට පෙර දක්වා තිබෙන ගුරුකුලවලින් ලක්නව් ගුරුකුලය, බෙනාරිස් ගුරුකුලය හා බිෂ්ණුපූර් ගුරුකුල 3 ලංකාව තුළ ව්‍යාප්ත වූ බව ඒ පිළිබඳ පර්යේෂණ පැවැත්වූ සංගීත ශිල්පීන් අදහන කරුණකි. පසුගිය ලිපියේ සඳහන් වූ ගුරුකුලවලට අමතරව පහත සඳහන් ගුරුකුල තිබෙන බන දැනගත යුතුය.

- ලක්නව් ගුරුකුලය
- දගර්වානි ගුරුකුලය
- ධර්භාංග ගුරුකුලය
- මයිහාර් ගුරුකුලය
- වානි ගුරුකුලය
- බිෂ්ණුපූර් ගුරුකුලය
- භටෂා ගුරුකුලය
- ඉන්දෝර් ගුරුකුලය
- දිල්ලි ඝරානා ගුරුකුලය
- ටේවටි ගුරුකුලය
- පටියාල ගුරුකුලය
- රාම්පූර් ගුරුකුලය
- සහෂ්වන් ගුරුකුලය
- අග්‍රා ගුරුකුලය
- කිරණා ගුරුකුලය
- බෙනදි බසාර් ගුරුකුලය
- ජායිපූර්

යන ඝරානා පිළිබඳ විස්තර එකින් රකට පසුකාලයක දී ලියා දැක්වීමට කැමතිය.

ගායන ප්‍රධාන සහ වාදන ප්‍රධාන ඝරානා ගුරුකුල කීපයක් ද ඇත. ඒ පිළිබඳ පසුව සඳහන් කරමි.

සිතාර් වාදකයෙක් වන මයිහාර් ඝරානාවාද දෙදෙනෙක් ඉතා සූක්ෂම ඉහළින් වාදනය ඉගෙන ගත්තත් පණ්ඩිත් රවිශංකර්ගේ නම ලොව පලත විය. එහෙත් ඔහුගේ භාර්යාව වන සිතාර්, සුර්බාර් වාදනය පිළිබඳ හසල දැනුමක් ඇති අණ්ණා පූර්ණා පණ්ඩිත් රවිශංකර්ට වඩා ඉහලින් සිටි බව බොහෝ දෙනා දනිති. මයිහාර් ඝරානාවේ මුල් නිර්මාතෘ වූ ඔස්තාද් අලවුදීන් ඛාන් සිසුවන් අතරින් මේ දෙදෙනා කැපී පෙනුණ දෙදෙනෙකි. නමුත් යම් වාසනාවකට පණ්ඩිත් රවිශංකර්ගේ වාදනය බොහෝ දෙනා පිළිගත් වාදන ශෛලියකි. ඔහුට සහය තබ්ලා වාදනය සැපවූයේ ඔස්තාද් අල්ලා රක්ඛා ඛාන් යන ශිල්පීන් බව ද පිළිගත් සත්‍යයි. අල්ලා රක්ඛා ගේ අභාවයෙන් පසු එතුමාගේ පුත්‍ර රත්නය වූ ශකීර් හුසේන් ඛාන් බව සංගීතවේදියෝ පිළිගන්නා සත්‍යයි.

මගේ ප්‍රථම ලිපියේ සඳහන් වූයේ ඝරානා නො-හොත් ගුරුකුලයන් පිළිබඳව ය. ශාස්ත්‍රීය සංගීතය හදාරන්නේ නැති කෙනෙකුට මෙම ගුර්කුල පිළිබඳ හැදෑරීමට කිසිඳු අවශ්‍යතාවයක් නොමැත. වර්ෂ 2000 පමණ සිට මෙම ගුරුකුලවලින් බිහිවූ සිසු සිසුවියන් අද භාරතයේ ජය කෙහෙළි නංවමින් සිටිති.

ඔවුන් ගායනයේ දී ශ්‍රැතියෙන් බැහැරව කිසි-වෙක් වයසට ගියත් ගායනා කරන්නේ නැත. ඒ ඔවුන්ගේ ගුරුවරුන් නිසාම විය හැක. පණ්ඩිත් ජස්රාජ් නැමති පඬිවරයා බොහෝ වයසට ගියත් අදත් ස්වර මත පිහිටා ගායනා කිරීම ඔහු ලැබූ නිපුණතාවය නිසයි. එය දවසකින්, මාසයකින්, අවුරුද්දකින් ගත හැක්කක් නොවේ. ගුරු ඇසුරින්, පඬිවරු ඇසුරින්, ඔස්තාද් ඇසුරින් ලබාගත් දායාදයක් කිවහොත් එය නිවැරදිය. තවමත් ඔහුගේ ගායනය අති මිහිරි, අතිකන්කළු බව විචාරකයෝ පවසති.

පසුගිය ලිපියේ පණ්ඩිත් රවිශංකර් මෙන් බො-හෝ හස්ත සාධන කළ සංගීතඥයෝ එමටය. එයින් සිතාර් වාදක හලීම් ජෆාර් ඛාන් නැමැත්තා ඉතා මනාව ලයාන්විතව එහෙත් ඉතා වේගයෙන් වාදනය කළහැකි ඔස්තාද් කෙනෙකි. නමුත් ඔහුගේ නම අභිබවා පණ්ඩිත් රවිශංකර් ඉදිරියෙන් සිටින බව ප්‍රසිද්ධ කරුණකි.

මේ ලිපියෙන් පසු සංගීතඥයෝ පිළිබඳව ලියා දැක්වීමට අදහස් කරමි.






## රතු පස්

**අජිත් පැරකුම් ජයසිංහ**

බොන වතුරට විස මුසු විණි
හද සෝ ගිනි බුරා නැගිණි
රතුපස්වල පස් රතු විණි
රතු ලේ ඒ මතින් හැලිණි

වතුර බිඳක සිසිල සොයා
පුතකු හඬා එලොව ගියා
නෙතින් නෙතට කඳුළු තියා
රටක කුසුම් පරව ගියා

එපුතු නිදන පොළව පලා
පිපුණු ඉසුරු මිලින වෙලා
අඳුරු හෙටක පුලින තලා
වැතිර ලොව ම නිසරු වෙලා

කතරක තනිකම සැප වෙ ද?
තිබහට උණු ලේ රස වෙ ද?
මිනිසුනි වෙඩි තැබූ ඔබ අද
හෙට පවසින් නො හඬාවිද?

**VACANCIES**

Cooks,
Floor staff
(full time and part time)

Please send resume to:
motto@live.com.au
or
Call on:
9381-1196

**DELIVERY DRIVERS NEED**

Courier drivers need for permanent runs start from Port Melbourne at 6.30am and finished around 4.00pm in Port Melbourne. Vans provided and immediately start. Guaranteed good income per week.

**Call Sam on 0414245870**
Send your resume to
dandytransport@yahoo.com.au